# සියම් උපසම්පදාව පිහිටුවීමෙහිලා විල්බාගෙදර රාලගේ කාර්යභාරය

# The Role of *Wilbagedara Rala* in Establishment of the Siyam Upasampada

හසිත චාමිකර ගුණසිංහ


## Abstrsct

In the early period of the Kandyan Kingdom, monks from the Rakkhanga established higher ordination twice in Sri Lanka. But the Rakkhanga Upasampada did not last long. In this background, the modern Buddhist renaissance began, and the Siyam Upasampada established in Sri Lanka under the leadership of Welivita Saranankara Thero. Therefore, envoys were sent to Siyam twice with King Sri Vijaya Rajasingha's patronage. But it failed due to various reasons. For the third time, the envoys sent to Siam with the patronage of King Kirti Sri Rajasingha succeeded in bringing Siamese monks to Sri Lanka. The Dutch sponsored it. Wilbagedara Rala, who left for Siam twice, made an essential contribution to the success of this mission. The literature source study was used as the research method to investigate the role of Wilbagedara Rala in establishing the Siam Upasampada. Wilbagedara Rala was chosen for this mission of being a friend of Saranankara Samanera, an expert in 18 languages, and dedicated to succeeding in his duties without wavering in the face of various obstacles and challenges. The Syama Varnanava and the report on the Syama mission, which he composed, reveal extensive information about this.

**Keyword:** Wilbagedara Rala, Siyam Upadasampada, Kingdom of Kandy, Buddhism in Sri Lanka

**හැඳින්වීම**

විල්බාගෙදර ග්‍රාමය පිහිටා ඇත්තේ වයඹ පළාතේ පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ය. පැරණි බෙදීම් අනුව මෙම ග්‍රාමය අයත් වන්නේ සත්කෝරළ මහදිසාවේ තිස්සව කෝරළයට ය. වඩිග දේශයේ විල්ගම්පුර රජතුමා හා මැරවර වංශික මැරවාර නම් පුද්ගලයා අතර වූ සටනකින් විල්ගම්පුර රජතුමා ජීවිතක්ෂයට පත්වූයෙන් රජතුමාගේ පුත් විල්ගේ රංගික කුමරු ආරක්ෂාව පතා ලක්දිවට පලා ආ බව කියැවේ. හලාවතින් මෙරටට ගොඩබට කුමරු කෝට්ටේ සත්වන බුවනෙකබාහු රජතුමා (1521-1551) බැහැදැක රන් පුවක්මලක් සහ රනින් කළ බළලෙකු පිරිනමා රජතුමාගේ සිත් දිනාගෙන තිස්සව කෝරළයේ වාසය කිරීම සඳහා අවසර ගැනීමට සමත්විය. 'බණ්ඩාර' යන ගෞරව නාමය ද රජතුමාගෙන් හිමිකරගත් විල්ගේ රංගික බණ්ඩාර කුමරු පදිංචිව සිටි ප්‍රදේශය පසුකාලීනව 'විල්බාගෙදර' නමින් ප්‍රකට වූ බව කියැවේ (ධර්මදාස, 2016:252).

මේ පිළිබඳ පවතින තවත් මීට සමාන ජනප්‍රවාදයකට අනුව වඩිග දේශය හා තෙළිඟු දේශය අතර සටනින් වඩිග රජතුමා මරණයට පත්වූයෙන් රජතුමාගේ එකම පුත් විල්ගේ රාංගීත කුමරු ඇතුළු පවුලේ පිරිසක් ජීවිතාරක්ෂාව පතා ලක්දිවට පලාවිත් තිබේ. රන් පුවක්මලක් සහ බළල් රුවක් නිර්මාණය කොට සත්වන බුවනෙකබාහු රජතුමාට පිරිනමා සිත් දිනාගත් විල්ගේ කුමරු මෙරට වාසය කිරීමට අවසර ලබාගත් අතර රජතුමා විසින් විල්ගේ රාංගීත කුමරු 'විල්ගේගෙදර නැතහොත් විල්බාගෙදර' යනුවෙන් නම් කළ බව කියැවේ. පඬුවස්නුවර පාලනය කරමින් සිටි පාලාවිට්ටි වැද්දා කැඳවා විල්බාගෙදර කුමරුට වාසය කිරීම සඳහා සුදුසු ප්‍රදේශයක් වෙන් කර දෙන ලෙස රජතුමා නියම කළ අතර කුමරු පදිංචි වූ නිවස පිහිටි ප්‍රදේශය පසුව 'විල්බාගෙදර' නම් විය. 'විල්ගම් බණ්ඩාර' නමින් හඳුන්වන ලද කුමරු පසුව ගල්ගමුව ප්‍රදේශයේ ප්‍රභූ පවුලක තරුණියක සරණ පාවා ගත් අතර ඔවුන් දෙපළට එක් පිරිමි දරුවකු වූ බව කියැවේ. ඔහුගෙන් ඇරඹී පරපුරේ දොළොස්වන පරම්පරාවේ

අයකු වශයෙන් විල්බාගෙදර රාල හඳුනාගැනේ (ජයරත්න, 2017).

## විල්බාගෙදර රාලගේ කුඩා අවධිය

විල්බාගෙදර රාලගේ පියා කොළමුන්නේ රාල නම් වූ අතර මව මැණික්හාමි නම් විය. ඔහුගේ මුල් නම වූයේ නයිදහාමි බව කියැවේ. කුඩා කල විල්බාගෙදර ශ්‍රී ශෛලතලාරාම පුරාණ විහාරයෙන් මූලික අධ්‍යාපනය හදාළ විල්බාගෙදර රාල පසුව වැඩිදුර අධ්‍යාපනය සඳහා පඬුවස්නුවර රජමහ විහාරස්ථ පණ්ඩුකාභය පිරිවෙනට ඇතුළත් වූ බවට ජනප්‍රවාද පවතී. සිංහල, පාලි, සංස්කෘත, දෙමළ සහ ලන්දේසි ආදී භාෂා රැසක් ප්‍රගුණ කළ ඔහුට 'භාෂාපණ්ඩිත' යන ගෞරව නාමය හිමි වූ අතර ඔහුගේ මුත්තණුවන් වූ රත්නායක මුදියන්සේ දැරූ මුදියන්සේ තනතුර හිමි වූ හෙයින් විල්බාගෙදර මුදියන්සේ/විල්බාගෙ දර මුහන්දිරම් යනුවෙන් ප්‍රකට වූ බව කියැවේ (ජයරත්න, 2017).

තවදුරටත් අධ්‍යාපනය හදාළ විල්බාගෙදර රාල සතු වූ භාෂාන්තර ඥානයේ ප්‍රතිඵලයක් වශයෙන් නැවත උපසම්පදාව පිහිටුවීමේ කාර්යයට සම්බන්ධ දූත මෙහෙවර සඳහා ඔහුව තෝරාගත් බව කියැවේ (ජයරත්න, 2017). එහෙත් මෙකී ජනප්‍රවාදවලට අනුව භාෂා දැනුම මත පදනම්ව මෙකී භාරධූර කාර්යය සඳහා විල්බාගෙදර රාල තෝරාගත් බව සඳහන් වීම ගැටලු සහගත ය. උපසම්පදාව භික්ෂූන් නොමැති වීමත් සමග ඇතිව තිබූ භාෂා ශාස්ත්‍ර පරිහානිය හේතුවෙන් එබඳු පිරිවෙන් අධ්‍යාපනයක් ලබාගැනීමේ හැකියාව එවකට පැවතියේ ද යන්න ද සැක සහිත ය. එබැවින් මේ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේදී හමුවන වැලිවිට සරණංකර සාමණේරයන් විසින් තබන පුස්කොළ සටහනක් අතිශය වැදගත් ය.

## වැලිවිට සරණංකර සාමණේරයන් සමග සම්බන්ධ වීම

උපසම්පදා භික්ෂූන් වැඩ නොසිටි මෙම කාලසීමාවේ පැවති ශාස්ත්‍ර පරිහානියෙන් සමාජය මුදාගැනීම සඳහා පුස්කොළ පොත් එකතු කරමින් ශාස්ත්‍ර ගවේෂණයක යෙදී සිටි සරණංකර සාමණේරයන්ට විල්බාගෙදර රාල නම් තැනැත්තාගේ නිවසේ වී අටුවේ දොර ලෑල්ල වෙනුවට තබා තිබූ පුස්කොළ ජාතක කථා පොත් වහන්සේ නමක් හමු වූ බව එහි සඳහන් වේ. එය දුටු උන්වහන්සේ වනයෙන් ගසක් කපා

ගත් ලෑල්ලකින් දොර පියනක් සකස් කොට දී එම පුස්කොළ පොත ලබාගත් බව එහිම අවසන් පත්ඉරුවකට සරණංකර සාමණේරයන් එක් කළ සටහනක දැක්වේ. ඒ බව එම සටහනේ සඳහන් වන්නේ මෙපරිද්දෙනි;

...ශ්‍රී බුධ වෂී දෙදහස් දෙසිය හතලිස් නවයට පැමිනි මෙම වසරෙහි සිරිවධීනපුරප්‍රවරයෙහි රජසිරි පැමිනි නරේන්‍ද්‍රසිංහ මිහිපතිහුගේ කාලයෙහි තුම්පනේ වැලිවිට සරණඞකර හෙරනුන්දෑ වන මවිසින් පරිහානිමුඛයෙහි තැබූ ධමීම ශාස්ත්‍ර දෙක නැවත ද නඟා සිටුවන අදහසින් පොත් රාසිකරණ සමයෙක මෙම ජාතක ධමීම දෙසනා පොත වනාහි විල්බාගෙදර එම රාලගේ වී අටුවේ දෙර ලෑල්ල වෙනුවට තබා තිබෙනු දැක වනයෙ ගහක් කපවා ලෑල්ලක් සැස දෙර පියනක් සාදා ඉදිකරවාදී පොත ලබාගත් බැවින් මෙකල පැවති ධමී ශාස්ත්‍ර දෙකේ දියුණුව මතු පහලවන්නන්ගේ දැනගැනීම සඳහා ලියා තබන්ට අදහස් කල බව දැනගත යුතුයි.*

මෙම සටහනට අනුව පැහැදිලි වන්නේ මෙහි එන විල්බාගෙ දර රාල එවකට කන්ද උඩරට ප්‍රදේශයේ සිටි උගත් ප්‍රභූ පවුලකින් පැවත ආ රදල ප්‍රධානියකු වන බවයි. ඔහු උගත් ප්‍රභූ පවුලකට අයත් වූ බව පැහැදිලි වන්නේ සරණංකර සාමණේරයන් විසින් ඔහුගේ නිවසේ තිබී පන්සිය පනස් ජාතක පොත් වහන්සේගේ පුස්කොළ පිටපතක් සොයාගැනීම හේතුවෙනි. සුලබව හමු නොවන, එසේම විශාල පත්ඉරු ගණනකින් සමන්විත වන පන්සිය පනස් ජාතක පොත් වහන්සේගේ පුස්කොළ පිටපතක් විල්බාගෙදර රාලගේ නිවසේ තිබෙන්නට ඇත්තේ ඔහුගේ පවුලේ ආදිතමයන් උගත් පුද්ගලයන් වීම නිසා විය යුතු ය. එහෙත් ඒ පිළිබඳ නිසි අවබෝධයක් හෝ විල්බාගෙදර රාලට නොතිබීමෙන් පැහැදිලි වන්නේ එවකට කන්ද උඩරට පැවති පැවති ශාස්ත්‍රීය පරිහානිකර තත්ත්වයයි.

මෙම ලේඛනයේ සඳහන් වන විල්බාගෙදර රාල යනු සියම් දූත මෙහෙවරට සම්බන්ධ විල්බාගෙදර රාල යැයි පිළිගැනීමේ වැඩි අවකාශයක් පවතී. මන්දයත් ඉහත සිදුවීමෙන් පසුව විල්බාගෙදර රාල සහ සරණංකර සාමණේරයන් අතර හිතවත්කමක් ගොඩනැගෙ න්නට ඇති අතර උන්වහන්සේගෙන් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමට ඔහු

පැමිණෙන්නට ඇතැයි ද විශ්වාස කළ හැකි හෙයිනි.

සංඝරාජ සාධු චරියාවේ සඳහන් වන අන්දමට සරණංකර සාමණේරයන් විසින් සිල්වත් සමාගමට සම්බන්ධව සිටි පිරිසගේ ශාස්ත්‍ර දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කොට තිබූ බව හඳුනාගත හැකිය. එයට අනුව අකුරු නොදත් අයට හෝඩියෙන් ද, අකුරු දත් අයට ඇණවුම් සකස්කඩයෙන් ද අධ්‍යාපනය ආරම්භ කර තිබෙන අතර වැල්ලේ බොහෝ සේ ලිවීමෙන් පසු අක්ෂර හඳුනාගැනීමට මෙන්ම අක්ෂර හුරු කරවීම සිදු කර තිබේ. පසුව ශතක පොත් උගන්වා කියවීම සහ ලිවීම හුරු කරවීම සිදු කර තිබෙන අතර ඉහළට ඉගෙනීමට සමත්කම් දක්වන්නන්ට පමණක් ව්‍යාකරණ, ධාතු පාඨ, නිඝණ්ඩු, බාලාවතාරය, පද සාධනය, වරනැගිල්ල ආදිය උගන්වා සප්ත විභක්තිය වැල්ලේ ලියවමින් හුරු කර වූ බව එහි සඳහන් වේ (සංඝරාජ සාධු චරියාව, 1997:11-12, 14).

මෙකී අධ්‍යාපන ක්‍රමය ඔස්සේ විල්බාගෙදර රාල ද සිය දැනුම වර්ධනය කරගන්නට ඇති බව විශ්වාස කළ හැකි අතර එහි ප්‍රතිඵලය වූයේ සිංහල, දෙමළ, අපභ්‍රංස, සංස්කෘත ඇතුලු භාෂා දහඅටක් සහ සිංහල, දෙමළ හා සංස්කෘත නිඝණ්ඩු මෙන්ම ව්‍යාකරණ පිළිබඳ විශාරදයකු බවට ඔහු පත්වීමයි. සමකාලීන කාව්‍ය ග්‍රන්ථයක් වන සඟරාජ විත්තිය පොතේ ඒ බව දැක්වෙන්නේ මෙසේ ය.

සතට මුනිඳු ගුණ සිතට දරා ගෙන දිවපුර සැප විඳිනටම  රුති

කපට නුදුරු පවු දුරැර දමා හැර සතර අපාදුක් ලං  නොවෙති

දසට බාස යන එළුදහංසක්‍රිත නිඝණ්ඩු ව්‍යාකරණ ද  දනිති

ලෙසට කෙනෙක් නැති විලස සමතයෙකි විල්බාගෙදරයි රලහමි  නිති

අක්සර ද යන දෙමළ සිංහල නිඝන්ඩු ද එති බාස දස  අට

දක්ෂ වෙමිනුත් නොයෙක් ශිල්පය පැති විල්බාගෙදර  මැතිඳුට

(සඟරාජ විත්තිය පොත, 2009:50-59 කවි)

මෙනිසා සරණංකර සාමණේරයන්ගේ හිතවතකු වීමට

අමතරව විල්බාගෙදර රාල පෘථුල භාෂා දැනුමක් සහිත ඉහළ ශාස්ත්‍ර ඥානයකින් හෙබි පුද්ගලයකු වීම හේතුවෙන් මෙම දූත මෙහෙවර සඳහා තෝරාගන්නට ඇතැයි පිළිගත හැකිය. විශේෂයෙන්ම විදෙස් රටකට පිටත් කරන දූත කණ්ඩායමකට මෙලෙස භාෂා කිහිපයක් හැසිරවිය හැකි පුද්ගලයකු සම්බන්ධ කිරීම අතිශය වැදගත් කරුණකි.

## සියමට පිටත් කරන ලද දෙවන දූත මෙහෙවර

සියමට පිටත් කළ දෙවන දූත පිරිසට ගිහි වස්ත්‍ර හඳවන ලද වැල්ලාවේ, ගලටොඹුවේ, දැලිවෙල, බෝතලේ හා ඕගඩපොල යන සිල්වතුන් සහ දොරණාගම මුහන්දිරම් රාල, මීදෙණියේ මුහන්දිරම් රාල හා විල්බාගෙදර රාල ඇතුළත් වූ අතර බාධාවකින් තොරව සියමට පැමිණීමට එම පිරිස සමත්විය. එහෙත් ශ්‍රී විජය රාජසිංහ රජතුමා (1739-1747) හදිසියේ අභාවයට පත් වූයෙන් උඩරට නව රජතුමාගේ අදහස නොදැන සියම් භික්ෂූන් ලක්දිවට එවීමට සියම් රජතුමා අකමැතිවීම නිසා ඔවුන්ට සිදුවූයේ පෙරළා ආපසු පැමිණීමට ය. නැවත පැමිණෙන අතරවාරයේ මුහුණදීමට සිදු වූ නොයෙක් අනතුරු හේතුවෙන් නිරුපද්‍රිතව පැමිණීමට හැකිවූයේ විල්බාගෙදර රාලට පමණි (සංඝරාජ සාධු චරියාව, 1997:16-17; වාචිස්සර හිමි, 2014:175-176).

## සියමට පිටත් කරන ලද තෙවන දූත මෙහෙවර

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ (1747-1782) අනුග්‍රහයෙන් වර්ෂ 1750 ජුනි මාසයේදී සියමට පිටත් කරන ලද තෙවන දූත මෙහෙවරට මාර්ගෝපදේශකයා ලෙස සහභාගි වූ දෙවන දූත මෙහෙවරේ අත්දැකීම් ඇති විල්බාගෙදර රාල, ඒ වන විට සියම් හා ලන්දේසි භාෂා පිළිබඳ අවබෝධයකින් ද පසුවන්නට ඇත. මෙම දූත කණ්ඩායම සඳහා විල්බාගෙදර රාල, පට්ටපොල මොහොට්ටාල, ඊරියගම රාල සහ අයිත්තාලියද්දේ රාල යන රදල ප්‍රභූවරුන් පමණක් සහභාගි වූ අතර නිරුපද්‍රිතව සියමට පැමිණි ඔව්හු සියම් රජතුමා බැහැදැක සියම් මහතෙරුන්වහන්සේලා මෙරටට වැඩම කරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරගැනීමට සමත්වූහ. ඒ අතරවාරයේ දී අගනගරය නැරඹීම හා විහාරස්ථාන වන්දනා කිරීම, කඨින පූජාවකට සම්බන්ධ වීම, සියම් ගඟේ දිය පහන් පූජාවකට සම්බන්ධ වීම සහ ශ්‍රී

පාදය වන්දනා කිරීම ආදී කටයුතු සිදු කිරීමට ද ඔවුන්ට හැකි වූ බව ස්‍යාම වර්ණනාවේ සඳහන් වේ (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:47-64).

අනතුරුව උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රධාන සියම් භික්ෂූන් වහන්සේලා ද, සියම් ඇමතිවරුන් සහ සේවක පිරිසක් ද, රන් පිළිමයක්, සියම් රාජ සන්දේශය සහ නොයෙක් පූජා භාණ්ඩ ද සහිතව පිරිස ලංකාවට පිටත්වීමට ගමන් ආරම්භ කර තිබේ. මෙහිදී විල්බාගෙදර රාල පමණක් සියම් පිරිස ගමන් ගත් සියම් නැවේ ගමන් කළ අතර අනෙක් ලාංකික දූතයන් සිවුදෙනා ගමන් ගන්නා ලද්දේ ඕලන්ද නෞකාවෙන් ය (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:69).

එතැන් පටන් සියම් මහතෙරුන් වහන්සේලා ලක්දිවට වැඩම කරවන තෙක් විල්බාගෙදර රාලට මුහුණදීමට සිදුවූයේ අභියෝග රැසකට ය. මින් පළමුවැන්න වූයේ අගනගරයේ සිට මුහුද දක්වා ගංගාවේ ඔස්සේ යාත්‍රා කළ නෞකා දෙක සාගරයට පැමිණීමට පෙර නැංගුරම්ලා සිටියදී දූත කණ්ඩායමේ සිටි පට්ටපොල මොහොට්ටාල හදිසියේ අභාවයට පත්වීමයි. ඔහුගේ අවසන් කටයුතු සියම් භික්ෂූන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් සිදුකිරීමෙන් අනතුරුව ඔහුගේ වස්තුව ලබාගැනීමට මීට පෙර අවස්ථාවක සියමට ගොස් එහි රැඳී සිටි නත්තඹුරේ ගණින්නාන්සේ විසින් ආරවුලක් ඇති කරන ලදී. ආර්යමුනි තෙරුන් වහන්සේට සහ සාමණේර නමකට මුගුරකින් පහරදුන් නත්තඹුරේ ප්‍රචණ්ඩ ලෙස හැසිරුණු හෙයින් ලංකාවට වැඩම කිරීමට නොහැකි බව සියම් භික්ෂූන් වහන්සේලා ප්‍රකාශ කළ බව විල්බාගෙදර රාල සිය වාර්තාවේ සඳහන් කරයි. මෙනිසා ලාංකික දූතයන්ට සිදුවූයේ නත්තඹුරේ සියමෙහි නවතා ලංකාවට බලා පිටත්වීමට ය (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:95-96).

නැවත වරක් ගමන් ආරම්භ කළ ද, විල්බාගෙදර රාල සහ සියම් මහතෙරුන් වහන්සේලා ගමන් ගත් සියම් නැවට ජලය කාන්දු වූ හෙයින් වටිනා වස්තු සම්භාරයක් දියට දමා අපහසුවෙන් මුවන්ලකෝන් නම් රටට යෑමට මෙම පිරිසට හැකිවිය. පසුව සිදු වූ විපත පිළිබඳ

සියම් රජතුමාට දැනුම්දීමෙන් පසු රජතුමාගේ නියමය වූයේ නැව අලුත්වැඩියා කොටගෙන අයෝධ්‍යාවට පැමිණිය යුතු බවයි. ඒ අනුව සියම් පිරිස සමග නැවත සියම බලා පිටත් වූ විල්බාගෙදර රාල සියම් රජතුමා හමු වූ අතර ඔහු තනිවීම පිළිබඳ පසුතැවිලි නොවන ලෙසත්, සියම් භික්ෂූන් ලංකාවට පිටත් කිරීමට තමන් කටයුතු කරන බවත් රජතුමා විසින් ප්‍රකාශ කරන ලදී (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:96-100).

මෙනිසා ලංකාවට පැමිණීම සඳහා මාර්ගයක් සෙවීමට උත්සුක වූ විල්බාගෙදර රාල ඕලන්ද බලකොටුවට පැමිණ මිරිගිය නම් ස්ථානයෙන් නැව නැඟීමට අවශ්‍ය කටයුතු සූදානම් කරගැනීමට සමත්විය. එහෙත් විශාල කුණාටුවක් ඇතිවී මිරිගියෙන් යාත්‍රා කළ ඇතුන් පැටවූ නැවක් ඇතුලු තවත් නැව් කිහිපයක් විනාශ වූයෙන් නැවත වරක් ලංකා ගමන වැළකිණි. මේ අතරවාරයේ සියමේ යුවරජතුමා අභාවයට පත්විය (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:100-101) එවැනි වාතාවරණයක විල්බාගෙදර රාල තමන්ට පැවරුණු රාජකාරිය ඉටුකිරීමට නොහැකිව බෙහෙවින් අපහසුතාවට පත්ව සිටි බව හඳුනාගත හැකිය.

මේ අතර දිනක් අලුයම් කාලයේදී විල්බාගෙදර රාල සිහිනයක් දුටු අතර එය ඔහුගේ වාර්තාවේ දැක්වෙන්නේ මෙලෙසිනි;

...සකල ශරීරය ගෝමර ඉසිච්චි ඇතුන් සමූහයකුත් ඇත්වාලගය පටන් කොන්ද දිග ද, ඇත් ආසනේ ද, කුඹස්තලේ ද, ඇත් සොඬ ද, ඇත් කෝෂය පටන් යටිතල්ල ගාවට බඩ ද මෙකී තැන් ශුභ්‍රවර්ණ පාට ද, දෙහැල්ලවොල ද කකුල්වලින් භාගයක් ද මෙකී තැන් කාලවර්ණ පාට ද මෙකී ලක්ෂණ ඇතුන් දස සදෙනෙකුත් සකල ශරීරය ශුභ්‍රවර්ණ ඇතකුත් මෙකී තරුණ ගාත්‍ර ඇති සොභාසම්පන්න ඇතුනුත් සමගම පිටත්ව ඇවිත් පුරන් කුඹුරක දිරච්චි පිදුරු තියෙන කලවිටකට ගියාම පඩිකාර මොහොට්ටාලත්, මට බාල මොහන්දිරමත් මේ දෙන්නා ඉස්කඩා ඇරලා මා සමග කථා කරන්ට ලංවෙන කොට මගේ දනිස්වලින් පහළ පූඩාවේ කනවා දැක ඇහැ ඇරුනා ය.... (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:101-102)

සුදු ඇතකු සහිත ඇත් රංචුවක් ගොයම් කැපූ කුඹුරකට පැමිණීමත්, ඒ අවස්ථාවේදී පඩිකාර මොහොට්ටාල තමන්ගේ බාල සොයුරා සමග පැමිණ හිස්වැසුම් ගලවා තමන් සමීපයට පැමිණීමත්, ඒ මොහොතේ තමන්ගේ පාදයේ දණිස්වලට පහළ කූඩැල්ලන් සමූහයක් සිටිනු දැකීමත් හේතුවෙන් තමන්ගේ කාර්යය ඉටුවන බව දැන විල්බාගෙදර රාල සතුටට පත්විය (වාචිස්සර හිමි, 2014:142).

මෙම සිහිනය දැක දෙවන දින ඕලන්ද නැව්පතින් දෙදෙනෙකු හමු වූ විල්බාගෙදර රාල ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව ලබාගැනීමට සමත් විය. ඒ යටතේ 'සේස්සිලී' නම් එම නැවෙන් පිරිස ලංකාවට බලා ගමන් ඇරඹීය. දුර ගෙවා බෙතාවියට පැමිණි අවස්ථාවේදී නැව අබලන් බව පෙනීගියෙන් පසුව එහි සිට 'ඕස්කාපැල' නම් නැවෙන් වර්ෂ 1753 මැයි මාසයේදී ත්‍රිකුණාමල වරායට ගොඩබැසීමට විල්බාගෙදර රාල ඇතුලු සියම් පිරිසට හැකිවිය (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:102-104). ඒ අනුව වසර තුනකට ආසන්න කාලයක් මෙම දූත මෙහෙවර වෙනුවෙන් කැපකිරීමට විල්බාගෙදර රාල ඇතුලු ලාංකික දූතයන්ට සිදු වූ බව පෙනේ. මෙරටට වැඩම කරන ලද සියම් මහතෙරුන් වහන්සේලා විසින් වර්ෂ 1753 ඇසළ පුර පසළොස්වක පොහෝදා නැවත වරක් මෙරට උපසම්පදාව පිහිටුවන ලද අතර එය අද දක්වාම පවත්වාගෙන එනු ලැබේ.

**විල්බාගෙදර රාල රාජ සම්මානයට පාත්‍රවීම**

අනේකවිධ බාධක හමුවේ අප්‍රතිහත ධෛර්යයකින් යුතුව, දිවි පරදුවට තබමින් සියම් මහතෙරුන් වහන්සේලා ලක්දිවට වැඩම කරවීම සඳහා කටයුතු කරන ලද විල්බාගෙදර රාලගේ සේවය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් අගය කරන ලද අන්දම පිළිබඳ දීර්ඝ විස්තරයක් කුසල ක්‍රියානු සන්දේශය නම් සමකාලීන මූලාශ්‍රයේ සඳහන් වේ. එහි දැක්වෙන අන්දමට විල්බාගෙදර රාලගේ පරපුරට හිමිව තිබූ 'ශ්‍රී රාම රත්නායක හේරත් මුදියන්සේ' යන පටබැඳි නාමය වෙනුවට රජතුමාගෙන් 'ශ්‍රී රාම රත්නායක රාජකරුණා සෙනෙවිරත්න පණ්ඩිත මුදලි' යන පටබැඳි නාමය සහිතව රන් මුදු හා මාල සහිත වස්තුව සහ විල්බාගෙදර, තුම්පනහ, ඇලවටුව, ගලගෙදර, හැවනේමඩවෙල,

හැමගහතැන්න, වැඋඩ, වැලිකුඹුර හා ගම්හත කුඹුරුගමුව යන ගම්පංගු ප්‍රවේණිකොට තුම්පනේ රට ද තඹ සන්නසකින් විල්බාගෙ දර රාලට හිමිව තිබේ (ධම්මානන්ද හිමි, 1969:247). වර්තමානය දක්වා පැවත එන විල්බාගෙදර රාලගේ ඥාතීන් සඳහන් කරන අන්දමට ඔහු විසින් සිදු කරන ලද සේවය අගය කරමින් රටෙන් භාගයක් ලබාදීමට රජතුමා ඉදිරිපත් වුවත්, විල්බාගෙදර රාල එය ප්‍රතික්ෂේප කර තිබේ. එම නිසා ඉහත සන්නසේ සඳහන් ගම් ඇතුලුව තුම්පනේ රටේරාල පදවිය ඔහුට හිමි වූ බව ඔව්හු පවසති (ජයරත්න, 2017).

එපමණක් නොව සමකාලීන සමාජයේ ඉහළ පිළිගැනීමකට ඔහුව පත්කරමින් ඇතෙකු ලබාදීමට ද රජතුමා කටයුතු කිරීමෙන් පැහැදිලි වන්නේ විල්බාගෙදර රාල ඉටු කළ සේවය උසස්ම අන්දමින් රජතුමා විසින් අගය කරන ලද බවයි (ධම්මානන්ද හිමි, 1969:247). විල්බාගෙදර පිහිටි විල්බාගෙදර රාල විසූ වලව්වට අයත් භූමියක මෙම ඇතා ගැට ගසන ලද ගල් කණුව තවමත් පවතින බව එම පවුලේ සාමාජිකයෝ කියති. එසේම වර්තමානයේ එම පවුල් පරම්පරාවේ ප්‍රධානියා වන රත්නායක මුදියන්සේලාගේ කරුණාසේන මහතා සතුව රජතුමා විසින් විල්බාගෙදර රාල වෙත පිරිනමන ලද සන්නස සුරක්ෂිතව පවතී. මීට අමතරව විල්බාගෙදර රාලගේ පරම්පරාවේ සාමාජිකයන් මහනුවරට ගිය අවස්ථාවලදී නවාතැන් ගැනීම සඳහා මල්වතු මහාවිහාරයේ කාමරයක් වෙන්කරදී තිබෙන බව ද පැවසේ (ජයරත්න, 2017).

## විල්බාගෙදර රාලගේ දූත මෙහෙවර පිළිබඳ වාර්තාව

ස්වකීය දූත මෙහෙවර සාර්ථක නිමා කිරීමෙන් පසු ඉන් නොනැවතී ඒ පිළිබඳ අංග සම්පූර්ණ වාර්තාවක් සම්පාදනය කිරීමට විල්බාගෙදර රාල කටයුතු කිරීම ප්‍රශංසනීය කාර්යයකි. වර්තමානයේදී රජය මගින් විදෙස් සංචාරයක නියැලෙන නිලධාරීන් විසින් ඉටු කළ යුතු කාර්යයක් වශයෙන් එම විදෙස් සංචාරය පිළිබඳ වාර්තාවක් රජයට ලබාදීම මීට නිදසුනක් ලෙස පෙන්වාදිය හැකිය. එම වගකීම අතීතයේ ද සිදු වූ බව මෙයින් හඳුනාගත හැකිය.

විල්බාගෙදර රාලගේ වාර්තාව මගින් ලාංකික දූත කණ්ඩායම උඩරට රාජධානියෙන් පිටත් වූ අවස්ථාවේ සිට නැවත වරක් මෙරටට

පැමිණීම දක්වා වූ සියලු සිදුවීම් පිළිබඳ මෙන්ම සියම් දේශය සහ එහි බෞද්ධාගමික පසුබිම පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට හැකිය. එපමණක් නොව තෙවන දූත මෙහෙවරේදී ඔහු මුහුණදුන් ගැටලුකාරී අවස්ථා මෙන්ම රුවල් නැව මගින් සිදු වූ ගමන්වල ඇති දුෂ්කරතා පිළිබඳව ද විස්තර කරන ඔහුගේ වාර්තාව සියම් උපසම්පදාව පිහිටුවීම සම්බන්ධ අධ්‍යයනය කිරීමේදී උපයෝගී කරගත හැකි වැදගත් මූලාශ්‍රයකි.

විල්බාගෙදර රාලගේ දූත මෙහෙවර පිළිබඳ වාර්තාව ස්‍යාමදූත වර්ණනාව යනුවෙන් ද හඳුන්වනු ලබන අතර ඊට සමාන තොරතුරු ඉදිරිපත් කෙරෙන ස්‍යාම වර්ණනාව නමින් ද කෘතියක් පවතී. එම කෘතිය ද විල්බාගෙදර රාලගේ කාර්යයක් බවට මහාචාර්ය පුඤ්චිබණ්ඩාර සන්නස්ගල මහතා අදහස් පළ කරයි (සන්නස්ගල, 2013:466-467). මේ පිළිබඳ වැඩිදුරටත් අදහස් දක්වන මහාචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමියන් සඳහන් කරන්නේ විල්බාගෙදර රාල විසින් පළමුව ස්‍යාම වර්ණනාව රචනා කරන්නට ඇති බවත්, පසුව එම විස්තරය තවදුරටත් සංවර්ධනය කරමින් විල්බාගෙදර මුදියන්සේගේ දූත ගමන නම් විස්තරය රචනා කරන්නට ඇති බවත් ය (ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන, 1998:22).

**සමාලෝචනය**

අභාවයට පත්ව තිබූ උපසම්පදාව මෙරට පිහිටුවීම සඳහා සරණංකර සඟරජ මාහිමියන් දැරූ ප්‍රයත්නයට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගෙන් ලැබුණු අනුග්‍රහය සේම විල්බාගෙදර රාල විසින් දක්වන ලද කැපවීම අනගි පිටුවහලක් විය. ඔහුගේ කැපවීම නොවන්නට ලක්දිව නැවත උපසම්පදාව පිහිටුවීම තවත් ප්‍රමාදවන්නට ඉඩ තිබූ බව පැහැදිලිවම හඳුනාගත හැකිය. සරණංකර සාමණේරයන්ගේ හිතවතෙකු වීම පමණක් නොව විවිධ භාෂා පිළිබඳ කුසලතාව හේතුවෙන් සියම් දූත මෙහෙවර සඳහා විල්බාගෙදර රාල තෝරාගැනෙන්නට ඇත. සමුද්‍ර තරණය දුෂ්කර වූ වකවානුවක දිවි පරදුවට තබා දෙවරක් සියම් දේශය බලා පිටත් වූවා සේම එහිදී මුහුණපාන්නට සිදු වූ අනේකවිධ බාධක හා අභියෝග හමුවේ විල්බාගෙදර රාල නොසැලී කටයුතු කළ අන්දම ඔහුගේ වාර්තාවෙන්

හඳුනාගත හැකිය. විල්බාගෙදර රාලගේ මෙහෙවර රජතුමා විසින් ඉතා ඉහළින් අගය කරන ලද බව ඔහුට හිමි වූ වරප්‍රසාදවලින් පැහැදිලි වේ. ස්වකීය දූත මෙහෙවර පිළිබඳ මතු පරපුරට දැනගැනීම සඳහා ඒ පිළිබඳ තොරතුරු ලේඛනගත කොට තැබීමට විල්බාගෙදර රාල විසින් කටයුතු කිරීම ද අතිශයින්ම ප්‍රශංසනීය ය.

## ආශ්‍රිත මූලාශ්‍රය

ජයරත්න, පුෂ්පකුමාර (2017), 'ලංකාවට උපසම්පදාව ගෙනෙන්නට තෙවරක්ම මුහුදෙන් ගිය විල්බාගෙදර මුදියන්සේ', ලංකාදීප, ඔක්තෝබර් 03.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1969), *මධ්‍යම ලංකා පුරාවෘත්ත*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ධර්මදාස, කේ.එම්. (2016), *වයඹ ඓතිහාසික සත් කෝරළය*, කර්තෘ ප්‍රකාශන

වාචිස්සර හිමි, කොටගම (2014), *සරණංකර සංඝරාජ සමය*, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

*සඟරාජ විත්තිය පොත* (2009), ජයරත්න, ඇල්.ඒ. සහ ජයරත්න එස්.එම්. (සංස්.), කර්තෘ ප්‍රකාශන, කෙසෙල්වත්ත.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (2013), *සිංහල සාහිත්‍ය වංශය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන* (1998), පඤ්ඤාලෝක හිමි, මීගොඩ (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*සංඝරාජ සාධු චරියාව* (1997), විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස (සංස්.), සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ.